# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - දකුණු පළාත
# கூட்டுறவு அபிவிருத்தி திணைக்களம் - தென் மாகாணம்
# DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT - SOUTHERN PROVINCE

**147/3, පෙට්ටිගලවත්ත, ගාල්ල.** 147/3, பெட்டிகலவத்தை, காலி. **147/3, Pettigalawatta, Galle.**

| | | | | | |
|---|---|---|---|---|---|
| කොමසාරිස් / ஆணையாளர் / **Commissioner** | 091-2235950 | කාර්යාලය / ෆැක්ස් / அலுவலகம் / பேக்ஸ் / **Office / Fax** | 091 2232291 | විද්‍යුත් තැපැල / ஈ-மேல் / **E-mail** | southerncoopdcd@gmail.com |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / **My No.** | DCDSP/02/01/2026/උප.අ | ඔබේ අංකය / உமது இல. / **Your No.** | | දිනය / திகதி / **Date** | 2026.02. 26 |

ගරු සභාපති/සාමාන්‍යාධිකාරි,
දකුණු පළාතේ ලියාපදිංචි සණස සමිති , සංගම් හා වෙනත් සමිති.

<u>සමුපකාර සංවර්ධන අරමුදල් ප්‍රතිපාදන මගින් උපකරණ ආධාර ලබා දීම 2026</u>

දකුණු පළාත් සමුපකාර සමිතිවල කටයුතු වඩාත් ක්‍රමවත් හා විධිමත් කිරීම සඳහා උක්ත ප්‍රතිපාදන මූලයන්ට අනුව, පහත ක්‍රියාකාරකම් යටතේ දෙපාර්තමේන්තුව මගින් දකුණු පළාතේ සමුපකාර සමිති වෙත ආධාර ලබා දීමට සැලසුම් කර ඇති අතර, මෙම ක්‍රියාකාරකම් යටතේ සමිතියේ අවශ්‍යතාවයේ ප්‍රමුඛතාවය අනුව ඉල්ලුම් කිරීම සඳහා අවස්ථාව ලබා දීමට නියමිතය.

**ක්‍රියාකාරකම්:**

1. ස.ණ.ස. හා වෙනත් සමිතිවල ගිණුම්කරණ ක්‍රියාවලිය වඩාත් පහසුකරලීම හා නිවැරදිව සිදු කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් හා ඊට අදාල පරිගණක දෘඩාංග ලබා දීම.
2. සමුපකාර සමිති නව තාක්ෂණයට අනුගත කිරීම සඳහා පරිගණක දෘඩාංග සහ අවශ්‍යතාවය අනුව වෙනත් තාක්ෂණික උපකරණ හා පහසුකම් ලබා දීම.
3. සමුපකාර සමිති සඳහා පරිගණක පුටු, මේස, කබඩ් සහ අවශ්‍යතාවය අනුව වෙනත් උපකරණ ආධාර ලබා දීම.
4. බැංකු ශාඛා සහ අලෙවිසැල් නවීකරණය කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
5. සමුපකාර සමිති සතු ඉන්ධනහල් නවීකරණය සඳහා අවශ්‍ය උපකරණ හා පහසුකම් සැලසීම.
6. සමුපකාරිකයන්ගේ ධාරිතා වර්ධනයට පුස්තකාල පොත් හා පහසුකම් ලබා දීම හා සංවර්ධනය කිරීම.
7. පාරිභෝගික අවශ්‍යතා මත භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය වෙනුවෙන් යටිතල පහසුකම් වර්ධනය සඳහා අවශ්‍ය සහාය ලබා දීම.

02. උක්ත ක්‍රියාකාරකම් යටතේ ආධාර ඉල්ලුම් කිරීම සඳහා පහත සඳහන් නිර්ණායක/ අවශ්‍යතා සපුරාලිය යුතු අතර, මෙම නිර්ණායක/ අවශ්‍යතා සපුරා ඇති ආකාරය අනුව උපකරණ ආධාර ලබා දීමේ ප්‍රමුඛතාගත සමිති ලේඛනය සකස් කිරීමට නියමිතය. ඉහත ක්‍රියාකාරකම් 7 අතුරින් ව්‍යාපෘති 03 ක් සඳහා පමණක් සමිතියේ ප්‍රමුඛතාවය මත ඉල්ලීම් කල යුතු වේ.

1. උක්ත පහසුකම් සමිතියේ වියදමෙන් අත්පත් කර ගැනීමට අපහසුතා පැවතීම.
2. සමුපකාර නීති රීති ප්‍රතිපාදන අනුව කටයුතු කිරීම හා දෙපාර්තමේන්තු නියමයන්ට අනුව ක්‍රියාත්මක වීම. (2019 අංක 06 දරණ දකුණු පලාතේ සමුපකාර ප්‍රඥප්තිය සමඟ හඳුන්වා දෙනු ලබන අතුරු ව්‍යවස්ථා සංශෝධනයට අනුගත වීම.)
3. 2024 මුදල් වර්ෂය දක්වා අවසාන ගිණුම් සකස් කර, දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. (මුදල් වර්ෂය අවසන් වී මාස 03 ක් ඇතුළත ගිණුම් ඉදිරිපත් කර ඇත්නම් ඉහල ප්‍රමුඛතාවයක් හිමිවේ.)
4. විගණන නියෝග ක්‍රියාත්මක කර තිබීම/ සමුපකාර අරමුදල් දායකත්වය නිසිපරිදි ගෙවා තිබීම/ සමුපකාර අරමුදලින් හෝ වෙනත් රජයේ ආයතනයකින් ලබාගත් ණය යාවත්කාලීනව ගෙවීම් කර තිබීම.
5. 2018/2019 හා 2021/2022 වර්ෂයන්හී සමුපකාර සමිති කාර්යසාධන තරඟාවලියට අයදුම් කර තිබීම.
6. දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සමිති සහභාගීත්වය ප්‍රමාණවත්ව ලබා දී තිබීම.


| | | | | | |
|---|---|---|---|---|---|
| නියෝජ්‍ය කොමසාරිස් / பிரதி ஆணையாளர் / **Deputy Commissioner** | 091-2235951 | ගණකාධිකාරි / கணக்காளர் / **Accountant** | 091-2226554 | සහකාර කොමසාරිස් (සංවර්ධන) / துணை ஆணையாளர் (அபிவிருத்தி) / **Ass. Commissioner (Dev.)** | 091-2235952 |

03. ඉන්ධනහල්, බැංකු, අලෙවිසැල් නවීකරණය සඳහා අයදුම් කරන්නේ නම්, පහත විශේෂ අවශ්‍යතා සපුරාලිය යුතු වේ.

1. ගොඩනැගිල්ලේ අයිතිය සමිතිය සතු වීම.
2. නවීකරණය හෝ අළුත්වැඩියා ඇස්තමේන්තු වියදමෙන් 50% ක් සඳහා සමිති දායකත්වය සැපයිය හැකි වීම.
3. ඔබ සමිතියේ සංවර්ධන සැලැස්මට ඇතුළත් කර තිබිය යුතු වීම සහ ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල/ කාරකසභා අනුමැතිය ලබා ගෙන තිබීම.

04. ඒ අනුව ඔබ සමිතිය ඉහත උපකරණ/ආධාර ලබා ගැනීමට අදහස් කරන්නේ නම් උපකරණ ආධාර ඉල්ලීම් සඳහා සමිති වෙත ඉදිරිපත් කර ඇති අයදුම්පත් කට්ටලය www.coop.sp.gov.lk වෙබ් අඩවිය මගින් බාගත කර සම්පූර්ණ කොට **2026.03.15** දිනට පෙර අදාල සමිති බල ප්‍රදේශයේ ස.සං.ප්‍රා.නි. වෙත පහත සඳහන් ලේඛන **අනුපිළිවෙලින්** අමුණා ඉදිරිපත් කලයුතු අතර අයදුම්පත් ඉදිරිපත් කල යුතු අවසාන දිනට පසුව ඉදිරිපත් වන ඉල්ලීම් සහ අඩුපාඩු සහිතව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1. ආධාර ඉල්ලීම් ලිපිය (ඉහත ක්‍රියාකාරකම් අනුව **ඉල්ලුම් කරනු ලබන උපකරණ/ ආධාර සම්බන්ධයෙන් සමිතියේ අවශ්‍යතාවය ප්‍රමුඛතා අනුපිළිවෙලින් සඳහන් කල යුතුවේ.)**
2. මේ සමඟ අමුණා ඇති අදාල අයදුම්පත්‍රය සම්පූර්ණ කර ඉදිරිපත් කල යුතු වේ.
3. ඉල්ලුම් කරනු ලබන ආධාර ලබා ගැනීමට අදාල අධ්‍යක්ෂක මණ්ඩල/ කාරකසභා තීරණය සහ මහ සභා තීරණය,( මහ සභාවේ ආවරණ අනුමැතිය ද සලකා බලනු ලැබේ).
4. අවසන් වරට විගණිත මූල්‍ය ප්‍රකාශනවල (ශේෂ පත්‍රයේ සහ ආදායම් ප්‍රකාශනයේ) සහතික කල පිටපත්
5. නිෂ්පාදන/ ව්‍යාපෘති ස්වරූපයේ අවශ්‍යතාවයන්ට ආධාර ඉල්ලුම් කරන්නේ නම්, එම ව්‍යාපෘතිය සඳහා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා දුන් ලිපියේ පිටපතක්
6. පුස්තකාල පොත් සහ ඊට අදාල පහසුකම් ඉල්ලුම් කරනු ලබන්නේ නම්, දැනට සමිතියේ පුස්තකාලයක් පවත්වා ගෙන යන්නේ ද/ නැද්ද යන වග ඉල්ලීම් ලිපියේ සඳහන් කල යුතුය. (පොත් ලබා දුනහොත් ගබඩා කිරීමට කබඩ් හා ආරක්ෂිත ස්ථානයක් පවතී ද යන වග)

05. පසුගිය වර්ෂ 03 ඇතුළත දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ආධාර ලැබී නොමැති සමුපකාර සමිති සඳහා ප්‍රමුඛතාවය හිමි වන බවත්, ආධාර ඉල්ලුම් කරන අවස්ථාවේදී යම් සමිතියක් විසින් ආධාර මුදල් ඉල්ලුම් කරන අවස්ථාව වන විට සමුපකාර අරමුදලින් ණය ලබාගෙන ඇතිනම් එකී ණය මුදල නිකුත් කර ලිත් මාස 12කින් පසුව ආධාර ඉල්ලුම් කල යුතු බවත් කාරුණිකව දන්වමි.

**සී. වික්‍රමසිංහ**
**සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (දෙ.ප)**
**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**
**දකුණු පළාත**

සී. වික්‍රමසිංහ,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

පිටපත් :

**1. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, ගාල්ල/ මාතර/ හම්බන්තොට - කා.දැ.ස/අ.ක.ස**
ස.සං.ප්‍රා.නි.වරුන් මගින් ඉදිරිපත් වන ඉල්ලුම් පත්‍ර පරීක්ෂා කර, ඒ අතුරෙන් ආධාර/උපකරණ ලබා දීමට සුදුසු සමිති, ප්‍රමුඛතාවය අනුව පෙලගැස්වූ ලේඛනයක් සකස් කර 2026.03.31 දිනට පෙර මා වෙත ඉදිරිපත් කිරීම සඳහා

**2. ස.සං.ප්‍රා.නි.** - කා.දැ.ස/අ.ක.ස. අදාල බල ප්‍රදේශයේ අදාල සියළුම සමිති දැනුවත් කිරීමට සහ ඉල්ලීම් ඉදිරිපත් වන සමිති වෙත ගොස්, ඉහත දක්වා ඇති නිර්ණායකයන්ට අනුව ආධාර ලබා දීමට ඇති සුදුසුකම් හා අවශ්‍යතාවය පිළිබඳවත්, අයදුම් පත්‍රයේ ඉදිරිපත් කර ඇති තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳවත් භෞතිකව පරීක්ෂාවට ලක් කොට, ආධාර සඳහා වඩාත් ඉහල අවශ්‍යතාවයක් ඇති සමිති තෝරා ප්‍රමුඛතා ලේඛනයක් සකස් කර 2026.03.20 දිනට පෙර දිස්ත්‍රික් සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීම සඳහා. (මෙහිදී අදාල සමිතිය අවශ්‍යතාවය මත ආධාර ඉල්ලුම් කර ඇති බව හා එම ආධාර සමිතිය විසින් අවභාවිතයකින් තොරව කාර්යක්ෂම ලෙස සමිතියේ කටයුතු සඳහා උපයෝජනය කරගනු ඇති බවට සෑහීමකට පත්වීම අත්‍යවශ්‍ය වේ.)